# කිරි අම්මාවරුන්ගේ දානය පිළිබඳව මානව හා සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (මොණරාගල, බිබිල ප්‍රදේශය ආශ්‍රිතව)

එ.එම්.එස්.යු රත්නපාල*

පත්තිනි දේව විශ්වාසය මෙරටට ගෙන එන ලද්දේ ගජබා රජ සමයේදී බව ලිඛිත සාක්‍ෂ්‍ය සනාථ කරයි. එතැන් පටන් නූතනය දක්වා එම විශ්වාස විකාසනය වෙමින් විවිධ පුද පූජා සංස්කෘතිකාංග බිහිවෙමින් පැවත එයි. කිරි අම්මා දානය යනු පත්තිනි දෙවියන් උදෙසා සිදු කරන එවැනි සුවිශේෂී පූජාමය කටයුත්තකි. බෞද්ධයන් අතර ප්‍රචලිත මෙම දානමය පූජාව එදිනෙදා ඇතිවන ලෙඩ දුක් කරදර ආදිය දුරුකර ගැනීම සඳහා සිදු වූ භාර භාර ඔප්පු කිරීමක් ලෙස ද පුරුද්දක් ලෙස ද සිදු කරයි. පුද්ගල චින්තනය හා සමාජ හැසිරීම සංවර්ධනය මෙවැනි සංස්කෘතිකාංග මගින් බලාපොරොත්තු විය හැකි නමුත් දිනෙන් දින වෙනස්වන සමාජ වටපිටාවන් හමුවේ කිරි අම්මා දානය වැනි පූජාමය වටිනාකම් සමාජයෙන් ගිලිහෙන අයුරු දක්නට ලැබේ.

පතිව්‍රතා ධර්මය සිහි කරමින් නොකිළිටි කාන්තාවන් පිරිසකට භක්ති පූර්වකව සිරිත් පරිදි දන් දීම කිරි අම්මා දානයකදී සිදු වේ. සංකල්පය අතින් එකම සන්දර්භයක් වටා කිරි අම්මා දානය ගොඩ නැගුනද එහි පූජාමය කටයුතු ප්‍රදේශයෙන් ප්‍රදේශයට තරමක් වෙනස් වේ. එසේ වීමට හේතුව එම ප්‍රදේශවලට අනන්‍ය වූ සිරිත්-විරිත්, ආකල්ප ඇදහිලි හා විශ්වාස සමග පත්තිනි දේව පූජාව මුහුවීම නිසා යැයි කෙනෙකුට කිව හැකිය. නමුත් ඊට ලබා දී තිබෙන බෞද්ධ මුහුණුවර විමසිය යුත්තේ ඊට වඩා ගැඹුරු සමාජීය පසුබිමක සිටය. කෙසේ වෙතත් මොණරාගල බිබිල ප්‍රදේශය ආශ්‍රිතව පවත්වන කිරි අම්මා දානය අනෙක් ප්‍රදේශවල කිරි අම්මා දානවලට වඩා තරමක් දුරට වෙනස් වන අතර එහි ප්‍රාදේශීය අනන්‍යතා ලක්‍ෂණ ද දැකිය හැකිය. දානය සඳහා පඬුර වෙනස් කිරීමේ සිට මාතාවන් දානය ගෙනයනතුරු සිදුකරන, සිදුවන සියල්ල පිළිබඳ අවධානය යොමු කරමින් කිරි අම්මා දානයෙහි සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක පැතිකඩ විමර්ශනය කිරීම මෙම ප්‍රස්තුතකරණයේ මූලික අරමුණයි.

ප්‍රමුඛ පදඃ පතිව්‍රතාව, කිරි අම්මා, අභිමතාර්ථසිද්ධිය, අනන්‍යලක්‍ෂණ, අධ්‍යයනය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය sanjeewakumara609@gmail.com